අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50
+94112785818
info@moe.gov.lk
www.moe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது இல.<br>My Ref. | ED/01/27/15/02-2026 | ඔබේ යොමුව<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2026-07-15 |

**චක්‍රලේඛ අංක 2007/20 දරන ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියේ 3.4.iv වගන්තිය මගින් පැවරී ඇති බලය ප්‍රකාර 2026.06.30 දින සිට ක්‍රියාත්මක වන ජාතික පාසල් ගුරු ස්ථාන මාරු නිර්ණායක ඇතුළත් කාර්ය පටිපාටි සංග්‍රහය**

පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ අවශ්‍යතා සඳහා ප්‍රමුඛතාව ලබා දෙමින් ගුරු සිසු දෙපිරිසගේ ම යහපත උදෙසා ජාතික ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කෙරේ. විනිවිදභාවයෙන් යුතු ව අපක්ෂපාති ව ජාතික පාසල් ගුරු ස්ථාන මාරු සිදු කිරීම සඳහා 2026.06.30 දින සිට මෙම කාර්ය පටිපාටි සංග්‍රහය බල පැවැත්වෙන අතර, 2025.08.19 දිනැති ED/01/27/15/01/2025-3 දරන "ජාතික පාසල් ගුරු ස්ථාන මාරු නිර්ණායක ඇතුළත් කාර්ය පටිපාටි සංග්‍රහය" ට අදාළව ගෙන ඇති ක්‍රියාමාර්ග වලට අගතියක් නොවන පරිදි මින් අවලංගු කරනු ලැබේ. නව කාර්යය පටිපාටි සංග්‍රහය අනුව කටයුතු කිරීම ජාතික පාසල් ගුරු ස්ථාන මාරු මණ්ඩලයේ සාමූහික වගකීමකි.

1. මූලික කරුණු

1.1. චක්‍රලේඛ අංක 2007/20 හා 2007.12.13 දිනැති ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියේ මූලික කරුණු වන ගුරු සිසු දෙපිරිසගේ ම සුබ සාධනය සැලසෙන පරිදි වාර්ෂික ගුරු ස්ථාන මාරු කාර්ය පටිපාටිය මෙන් ම අනිවාර්යය ගුරු ස්ථාන මාරු කාර්ය පටිපාටිය ද ක්‍රියාත්මක කළ යුතු ය.

1.2. පාසලක අධ්‍යයන කාර්ය මණ්ඩලය නිර්ණය කිරීමට අදාළ ව නිකුත් කර ඇති 06/2021 චක්‍රලේඛය ප්‍රකාර ව ජාතික පාසල්වල විෂයානුබද්ධ ව පවතින ගුරු ඌනතා හා අතිරික්තතා හඳුනාගෙන, අංක 2007/20 දරන ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියේ සඳහන් කරුණු ද පදනම්ව, ගුරු අතිරික්තතා හා ඌනතා තුලනය වනසේ ජාතික පාසල් ගුරු මාරු මණ්ඩලය කටයුතු කළ යුතු ය. ගුරුවරුන්ගේ සේවය ඌන උපයෝජනය වන සේ අතිරික්ත ඇති වන ආකාරයට ස්ථාන මාරු නොකළ යුතු ය.

1.3. ස්ථාන මාරු අයදුම් කිරීම

1.3.1. ගුරුවරුන් විසින් අදාළ වර්ෂයේ නියමිත දිනට පෙර මාර්ගගත ව ස්ථාන මාරු අයදුම් කිරීම කළ යුතු අතර එහි මුද්‍රිත පිටපතක් වැටුප් ලබන පාසලේ විදුහල්පති වෙත භාර දිය යුතු ය.

1.3.2. විදුහල්පති විසින් ස්ථාන මාරු අයදුම් කරන සියලු ගුරුවරුන්ගේ ස්ථාන මාරු අයදුම්පත්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති උපදෙස් ප්‍රකාර ව සහතික කර සියලු ගුරු ස්ථාන මාරු අයදුම්පත් එක් ගොනුවක් ලෙස සකස් කර අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අතින් ගෙනැවිත් භාර දිය යුතු ය.

1.3.3. මාර්ගගතව ඉදිරිපත් කරන සියලු වාර්ෂික ගුරු ස්ථාන මාරු අයදුම්පත් විදුහල්පති නිර්දේශ සහිත ව ඉදිරිපත් කිරීම විදුහල්පතිගේ වගකීමක් වේ.

1.4. වාර්ෂික ගුරු ස්ථාන මාරු සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම් නොකළ ගුරුවරුන්ගේ ඉල්ලීම් ගුරු ස්ථාන මාරු මණ්ඩල මගින් කිසිසේත්ම සලකා නොබැලිය යුතු ය.

1.5. එසේ වුව ද අනිවාර්ය ගුරු ස්ථාන මාරු සඳහා මෙහි පහත 2.3 හි දක්වා ඇති උපරිම සේවා කාලය සපිරූ ගුරුවරුන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම් කර නොමැති වුවහොත් එම ගුරුවරුන්ගේ අයදුම්පත් අධ්‍යාපන අධ්‍යක්ෂ, ජාතික පාසල් ගුරු ස්ථාන මාරු වෙත අතින් ගෙනවිත් භාර දීම විදුහල්පතිගේ වගකීම වේ.

1.6. ගුරුවරයකුට තම අභිමතය පරිදි ජාතික පාසල් 05 ක් සහ පළාත් රාජ්‍ය සේවයේ ගුරු සේවයට අයදුම් කිරීමට අවස්ථාව ලබා දී ඇත. ස්ථාන මාරුව ලබා දීම සඳහා ගුරුවරයා විසින් නම් කර ඇති ජාතික පාසල්වලට ප්‍රමුඛතා ව ලබා දෙන අතර එම පාසල්වල පුරප්පාඩු නොමැති නම් හා ගුරුවරයා විසින් පළාත් රාජ්‍ය සේවයට යාමට අයදුම් කර තිබේ නම් පළාත් රාජ්‍ය සේවයට නිදහස් කිරීමට නිර්දේශ කළ හැකි ය. එම ක්‍රියාවලිය සිදු කරන තෙක් පළාත් පාසලකට අනුයුක්ත කරනු ලැබේ.

2. වාර්ෂික ගුරු ස්ථාන මාරු හා අනිවාර්යය ගුරු ස්ථාන මාරු

2.1. අදාළ වර්ෂයේ වාර්ෂික ගුරු ස්ථාන මාරු සඳහා සලකනු ලබන දිනය වන විට එක ම පාසලේ උපරිම සේවා කාලය හෝ ඊට වැඩි සේවා කාලයක් හෝ සම්පූර්ණ කළ ගුරුවරුන් අනිවාර්ය ගුරු ස්ථාන මාරුවීම්වලට යටත් වේ.

2.1.1. අනිවාර්යය ගුරු ස්ථාන මාරු සඳහා යටත් වන ගුරුවරුන්ගේ වයස් සීමාව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත් වේ.

2.2. එහෙත් උක්ත වයස ඉක්මවන ගුරුවරයකු වුව ද ඔහුගේ/ ඇයගේ කැමැත්ත මත දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරු කිරීමේ හැකියාව පවතින අතර සේවා අවශ්‍යතාව මත දිස්ත්‍රික්කය තුළ පිහිටි, පදිංචියට ආසන්න සේවා ස්ථානයකට ස්ථාන මාරු කිරීමට නිර්දේශ කිරීමේ හැකියාව පවතී.

2.3. 2027 වසරට අදාළ ව 2026.12.31 දිනට එක ම පාසලේ උපරිම සේවා කාලය වසර 08 ක් සහ වයස අවුරුදු 55 ට අඩු ගුරුවරුන්ව අනිවාර්ය ගුරු ස්ථාන මාරු වලට යටත් ලෙස සලකනු ලැබේ.

2.4. අනිවාර්යය ගුරු ස්ථාන මාරු සඳහා යටත් නමුත් ස්ථාන මාරු අයදුම් නොකරන ගුරුවරුන්, සේවා අවශ්‍යතාව මත ස්ථාන මාරු කිරීමට ගුරු ස්ථාන මාරු මණ්ඩලයට බලය පැවරේ.

2.5. ස්ථාන මාරුවක් අපේක්ෂා කරන ඕනෑ ම ගුරුවරයකුට මේ යටතේ අයදුම් කළ හැකි ය. මුල් පත්වීම ලබා සේවය කරන ගුරුවරුන් විසින් තම මුල් පත්වීම් ලිපියට අනුව අදාළ පාසලේ සේවය කළ යුතු අවම සේවා කාලය සම්පූර්ණ කර තිබිය යුතු වුවත් අවම සේවා කාලය සම්පූර්ණ නොකළ ගුරුවරයකුට වුවද ඉහත 1.2 හි සඳහන් කරුණු යටතේ ගුරු තුලනයක් සිදු කිරීම තුළින් වඩා ඵලදායී සේවයක් ලබා ගැනීමේ අරමුණින් ස්ථාන මාරු ඉල්ලීමේ අවස්ථාව හිමිවනු ඇත.

2.6. 2026 වර්ෂයේ සිට ඉදිරියට පහත අංක 04 යටතේ දක්වා ඇති කරුණු අනුගමනය කරමින් හා ඇමුණුම් අංක 01 මඟින් ඉදිරිපත් කර ඇති පාසල් කාණ්ඩකරණ ලේඛනය පදනම් කර ගනිමින් ගුරු ස්ථාන මාරු සිදු කෙරේ.

3. අභියාචනා

3.1. 2026 ස්ථාන මාරු තීරණ නිල වශයෙන් දැනුම් දී දින 14 ක් ඇතුළත ගුරුවරයා විසින්ම අභියාචනා මාර්ගගතව ඉදිරිපත් කළ යුතු අතර, අදාළ අභියාචනා විදුහල්පති විසින් නිර්දේශ කළ යුතු ය.

4. ගුරු ස්ථාන මාරු සම්බන්ධ පොදු නිර්ණායක.

4.1. A කාණ්ඩයේ පාසලක සේවය කරන ගුරුවරයකුට B/ C/ D කාණ්ඩයේ පාසලකට ස්ථාන මාරු විය හැකි ය.එසේ ස්ථාන මාරු වීම් ලැබ B/ C/ D පාසලක අවම වසර 05ක කාලයක් සේවය කිරීමෙන් අනතුරු ව, තමා පෙර වසර 03ක් හෝ ඊට වැඩි කාලයක් හෝ සේවය කළ A කාණ්ඩයේ පාසලට/පාසල්වලට හැර A කාණ්ඩයේ වෙනත් පාසලකට නැවත ස්ථාන මාරු අයදුම් කළ හැකි ය.

4.1.1. A කාණ්ඩයේ පාසලක/පාසල්වල අනුයාත හා අඛණ්ඩ සේවා කාලය වසර 03කට අඩු වන විට නැවත A කාණ්ඩයේ පාසලකට ස්ථාන මාරු ඉල්ලුම් කළ හැකි නමුත් මින් පෙර වසර 03ක් හෝ ඊට වැඩි කාලයක් හෝ සේවය කළ A කාණ්ඩයේ පාසලට/පාසල්වලට නැවත ස්ථාන මාරු විය නොහැකි ය.

4.2. B කාණ්ඩයේ පාසලක සේවය කරන ගුරුවරයකුට A/ B/ C/ D කාණ්ඩයේ පාසලකට ස්ථාන මාරු විය හැකි ය. එසේ ස්ථාන මාරු වීම් ලැබ වසර 05කින් පසු නැවත තමා සේවය කළ B කාණ්ඩයේ පාසලකට ස්ථාන මාරු විය හැකි නමුත්, තමා පෙර වසර 03ක් හෝ ඊට වැඩි කාලයක් හෝ සේවය කළ A කාණ්ඩයේ පාසලකට නැවත ස්ථාන මාරු විය නොහැකි ය.

4.3. C කාණ්ඩයේ පාසලක සේවය කරන ගුරුවරයකුට A/ B/ C/ D කාණ්ඩයේ පාසලකට ස්ථාන මාරු විය හැකි ය. එසේ ස්ථාන මාරු වීම් ලැබ වසර 03කින් පසු නැවත තමා සේවය කළ C කාණ්ඩයේ පාසලකට ස්ථාන මාරු විය හැකි නමුත්, තමා මින් පෙර වසර 03ක් හෝ ඊට වැඩි කාලයක් හෝ සේවය කළ A කාණ්ඩයේ පාසලකට නැවත ස්ථාන මාරු විය නොහැකි ය.

4.4. D කාණ්ඩයේ පාසලක සේවය කරන ගුරුවරයකුට A/ B/ C/ D කාණ්ඩයේ පාසලකට ස්ථාන මාරු විය හැකි ය. එසේ ස්ථාන මාරු වීම් ලැබ වසර 02කින් පසු නැවත තමා සේවය කළ D කාණ්ඩයේ පාසලකට ස්ථාන මාරු විය හැකි නමුත්, මීන් පෙර වසර 03ක් හෝ ඊට වැඩි කාලයක් හෝ සේවය කළ A කාණ්ඩයේ පාසලකට නැවත ස්ථාන මාරු විය නොහැකි ය.

4.5. කාණ්ඩ කිහිපයකට අයත් පාසල්වල සේවය කරන ගුරුවරුන් කිහිප දෙනෙකු එක ම ජාතික පාසල ඉල්ලා ඇති අවස්ථාවක ප්‍රමුඛතාව ලබා දිය යුත්තේ දැනට සේවය කරන පාසලෙහි සේවා කාලය ද සැලකිල්ලට ගෙන D, C, B, A යන අනුපිළිවෙලට ය.

4.6. එක ම ජාතික පාසලේ ගුරුවරුන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හෝ එක ම ජාතික පාසල අයදුම් කර ඇති අවස්ථාවල දී දැනට සේවය කරන පාසලේ වැඩි ම සේවා කාලයක් සහිත ගුරුවරයාට ප්‍රමුඛතාව දෙනු ලැබේ.

4.7. ඇමුණුම 02 යටතේ දක්වා ඇති හුදෙකලා ජාතික පාසල්වල සේවය කරන ගුරුවරුන්, නිර්ණායකවලට අනුව ස්ථාන මාරු කළ නොහැකි බවට ගුරු ස්ථාන මාරු මණ්ඩලය තීරණය කරන්නේ නම්, ඒ බව සටහන් කර එම වර්ෂය සඳහා ස්ථාන මාරු නොකිරීමට නිර්දේශ ලබා දිය යුතු ය.

4.8. එකම පාසලේ සිටිය හැකි උපරිම සේවා කාලයට වඩා අඩු සේවා කාලයක් සහිත ව ගුරුවරයාගේ අවශ්‍යතාව මත සිදු කරනු ලබන ගුරු ස්ථාන මාරු ඉල්ලීම් සඳහා ඉල්ලුම් කළ ජාතික පාසල ම ලබා දිය නොහැකි අවස්ථාවල පහත පරිදි කටයුතු කළ යුතු ය.

4.8.1. විදුහල්පති විසින් අනුප්‍රාප්තිකයකු සහිත ව නිදහස් කිරීමට නිර්දේශ කර ඇත්නම් වෙනත් පාසලක් ලබා නොදිය යුතු ය.

4.8.2. විදුහල්පතිවරයෙකු විසින් අනුප්‍රාප්තිකයකු රහිත ව නිදහස් කිරීමට නිර්දේශ කර ඇත්නම් අදාළ ගුරුවරයාගේ කැමැත්ත ලිඛිත ව ලබා ගෙන පදිංචි ස්ථානයේ සිට ස්ථාන මාරු ලබාදිය හැකි සාධාරණ දුරකින් පිහිටි වෙනත් ආසන්න ජාතික පාසලක් ලබා දීමට ගුරු ස්ථාන මාරු මණ්ඩලය කටයුතු කළ යුතු ය.

4.9. අනිවාර්යය ගුරු ස්ථාන මාරුවල දී ඉල්ලුම් කරන ජාතික පාසල ලබාදිය නොහැකි වන්නේ නම්, ගුරුවරයාගේ පදිංචි ස්ථානයේ සිට සාධාරණ දුරකින් පිහිටි, ස්ථාන මාරු ලබාදිය හැකි වෙනත් ආසන්න ජාතික පාසලක් ලබා දීමට ගුරු ස්ථාන මාරු මණ්ඩලය කටයුතු කළ යුතු ය.

5. විෂයය හා මාධ්‍යය

5.1. ගුරු ස්ථාන මාරු සිදු කිරීමේ දී පත්වීම් විෂයය හා මාධ්‍යය හෝ ස්ථාන මාරු සිදුකරන වසරට ආසන්න අවම වසර 05ක් තුළ උගන්වා ඇති විෂයය හා මාධ්‍යය හෝ අදාළ කර ගත යුතු ය.

5.2. යම් ගුරුවරයකු එක් විෂයයකට වැඩි සංඛ්‍යාවක් උගන්වන අවස්ථාවක දී පහත පරිදි කටයුතු කළ යුතු ය.

5.2.1. 6-11 ශ්‍රේණිවලට අදාළ විෂයයන් උගන්වන්නේ නම් ගුරුවරයා ස්ථාන මාරු අපේක්ෂා කරන විෂයට අදාළව ස්ථාන මාරු කළ යුතු ය.

5.2.2. 6-11 ශ්‍රේණි විෂයය/විෂයයන් සහ අ.පො.ස. (උ/පෙළ) විෂයය/විෂයයන් ද උගන්වන, එම විෂයයට අදාළ ව උපාධිය හෝ ඩිප්ලෝමාවක් හදාරා ඇති ගුරුවරයකු නම්, එම ගුරුවරයා උගන්වන අ.පො.ස. (උ/පෙළ) විෂයයට අදාළ ව ස්ථාන මාරු කිරීම.

5.2.3. 6-11 ශ්‍රේණි විෂයය/විෂයයන් සහ අ.පො.ස (උ/පෙළ) විෂයය/විෂයයන් ද උගන්වන, එම විෂයයට අදාළ ව උපාධිය හෝ ඩිප්ලෝමාවක් හදාරා නොමැති ගුරුවරයකු නම්, එම ගුරුවරයා ස්ථාන මාරු අපේක්ෂා කරන විෂයයට අදාළව ස්ථාන මාරු කළ යුතු ය.

5.3. ප්‍රාථමික ශ්‍රේණිවල උගන්වන ගුරුවරුන්ගේ ස්ථාන මාරු, ප්‍රාථමික අධ්‍යාපන අවධි (1, 2 ශ්‍රේණි/ 3, 4 ශ්‍රේණි/ 5 ශ්‍රේණිය) සලකා සිදු කළ යුතු ය.

5.4. දහතුන් වසරක අඛණ්ඩ අධ්‍යාපන විෂය ධාරාව යටතේ බඳවා ගත් ගුරුවරුන් උසස් පෙළ වෘත්තීය විෂය ධාරාව ක්‍රියාත්මක වන පාසල් අතර පමණක් ස්ථාන මාරු සිදු කළ යුතු ය. එසේ ස්ථාන මාරු

කිරීමට ජාතික පාසල් නොමැති අවස්ථාවල දී පමණක් පළාත් රාජ්‍ය සේවයට නිදහස් කිරීමට පියවර ගත යුතු ය.

5.5. විශේෂ අධ්‍යාපන විෂය පත්වීම් සහිත ගුරුවරුන්, විශේෂ අධ්‍යාපන ඒකක සහිත හා විශේෂ අධ්‍යාපන විෂය ඉගැන්වීමේ නිරත පාසල් අතර පමණක් ස්ථාන මාරු සිදු කළ යුතු ය. එසේ ස්ථාන මාරු කිරීමට ජාතික පාසල් නොමැති අවස්ථාවල දී ඔවුන් පළාත් රාජ්‍ය සේවයට නිදහස් කිරීමට පියවර ගත යුතු ය.

5.6. ගුරු ස්ථාන මාරු මණ්ඩල මගින් පළාත් රාජ්‍ය සේවයට මුදා හැරීමට නිර්දේශ වන ගුරුවරුන් පළාත් රාජ්‍ය සේවයට මුදා හැරීම සඳහා අදාළ ආකෘති පත්‍රය හා අනෙකුත් ලේඛන නිසි පරිදි සම්පූර්ණ කර, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරු ආයතන ශාඛාවට ඉදිරිපත් කළ යුතු ය.

6. අතිරික්ත ගුරුවරුන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය

6.1. අංක 06/2021 චක්‍රලේඛයට අනුව කිසියම් භාෂා මාධ්‍යයකට අදාළ ව යම් විෂයයකට අනුමත ගුරු සංඛ්‍යාව ඉක්මවා ගුරුවරුන් ස්ථිර සේවයේ යෙදී සිටින විට එම විෂයයට ගුරු අතිරික්තයක් තිබේ යැයි තීරණය කරනු ලැබේ.

6.1.1. යම් පාසලක ගුරු අතිරික්තයක් පවතින අවස්ථාවල විෂයානුබද්ධ ව ගුරුවරුන් අතරින් එම පාසලේ වැඩි ම සේවා කාලයක් සහිත ගුරුවරයා අතිරික්ත ලෙස සැලකේ. එසේ වුව ද පාසලේ සිටිය හැකි උපරිම සේවා කාලය නොඉක්ම වූ හා ස්ථාන මාරු අපේක්ෂා නොකරන ගුරුවරුන් අනුමත ගුරු සංඛ්‍යාවට සමාන ව සිටිය දී, නව ගුරුවරයකු ස්ථාන මාරු ලබා පැමිණ ඇත්නම් එලෙස අවසානයට පැමිණි ගුරුවරයා අතිරික්ත ගුරුවරයකු ලෙස සැලකේ.

6.1.2. යම් විෂයයකට අදාළ ව අනුමත ගුරු සංඛ්‍යාව සිටින / ගුරු අතිරික්තයක් පවතින පාසලකට එම විෂයය සඳහා ගුරුවරුන් තවදුරටත් ස්ථාන මාරු නොකිරීමට වග බලා ගත යුතු ය.

6.2. යම් විෂයයක් සඳහා අතිරික්ත වන ගුරුවරයකු හට ස්ථාන මාරු ලබා දීමේ දී, ඉල්ලුම් කර ඇති පාසල්වල පුරප්පාඩු නොමැති නම් ගුරුවරයාට ලබා දෙන පාසල තීරණය කිරීම සඳහා ගුරුවරයා පදිංචි ස්ථානයේ සිට යෝජිත පාසලට ඇති දුර සමග සාධාරණ මානුෂික කරුණු සැලකිල්ලට ගත යුතු ය.

6.3. අතිරික්ත වන අවස්ථාවල දී, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන අනිවාර්ය ගුරු ස්ථාන මාරු සඳහා යටත් වන වයස් සීමාවට වඩා වැඩි ගුරුවරුන්, ගුරුවරයාගේ කැමැත්ත රහිත ව දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරු නොකළ යුතු ය.

6.4. යම් විෂයයකට ගුරු අතිරික්තයක් පවතින නමුත් එම අතිරික්ත ගුරුවරුන් වෙනත් විෂයයක් උගන්වන අවස්ථාවක දී, පාසලේ කාල සටහන් සංශෝධනයක් මගින් එම වෙනත් විෂය, අදාළ විෂයයට සුදුසුකම් සහිත වෙනත් ගුරුවරුන්ට පැවරිය හැකිදැයි සොයා බැලිය යුතු ය. එසේ කළ නොහැකි අවස්ථාවන්හි දී එම අතිරික්ත ගුරුවරුන් ස්ථාන මාරු කළ යුත්තේ ඔවුන් විසින් උගන්වනු ලබන එම වෙනත් විෂයයට සුදුසු අනුප්‍රාප්තිකයකු ලබා දීමෙන් පසු ව වේ.

7. පොදු කරුණු

7.1. ගුරු ස්ථාන මාරු අයදුම් කරන වර්ෂයේ හා ස්ථාන මාරු ලැබීමට නියමිත වර්ෂය ද ඇතුළත් ව අධ්‍යයන නිවාඩු/ සේවා අවශ්‍යතා මත විශ්ව විද්‍යාල, ගුරු විද්‍යාල, තොරතුරු තාක්ෂණ හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන කේන්ද්‍රස්ථාන, විද්‍යා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන ,ජාතික අධ්‍යාපන ආයතනය, කලාප අධ්‍යාපන කාර්යාල හා සක්‍රිය සේවයට අනුයුක්තව සේවය කරන ගුරුවරුන් මෙම ගුරු ස්ථාන මාරුවලට යටත් වේ. නමුත් මෙම ගුරුවරුන් ස්ථාන මාරු කරන පාසලේ ගුරුවරයකුට අනුප්‍රාප්තිකයෙකු ලෙස ගැලපීම් නොකළ යුතු වේ. (විදුහල්පති විසින් මෙම ගුරුවරුන් පිළිබඳ තොරතුරු ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ශාඛාව වෙත එවිය යුතු ය.)

7.2. අනිවාර්යය ගුරු ස්ථාන මාරුවලට යටත් වන ගුරුවරුන්ගේ පෞද්ගලික නිවාඩු, පෞද්ගලික විදේශ නිවාඩු, ප්‍රසූත නිවාඩු හා පෞද්ගලික අවශ්‍යතා මත අනුයුක්ත වීම් ආදිය වැටුප් ලබන පාසලේ සේවා කාලයට ගණනය කෙරේ.

7.3. ගුරුවරයාට අදාළ ව වෛද්‍ය හේතු ඉදිරිපත් කරන්නේ නම් හෝ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සිටින්නේ නම් හෝ, ඒ සඳහා විශේෂ ආකෘතියක් ඇමුණුම TTB/3 මගින් හඳුන්වා දී ඇත. එය රජයේ රෝහලක හෝ ලියාපදිංචි පෞද්ගලික රෝහලක හෝ තමා ප්‍රතිකාර ගන්නා විශේෂඥ වෛද්‍යවරයා වෙතින් සම්පූර්ණ කර නිර්දේශ සහිත ව එවිය යුතු අතර එම නිර්දේශ අනුව ලබා දෙන ගුරු ස්ථාන මාරු තීරණය පිළිබඳ අභියාචනා ඉදිරිපත් කරන අවස්ථාවලදී, එම අභියාචනා වෛද්‍ය මණ්ඩලයක් වෙත යොමු කරනු ලැබේ.

7.4. අනිවාර්යය ගුරු ස්ථාන මාරු අවලංගු කිරීමට කරනු ලබන විශේෂ හේතු සහිත ඉල්ලීම් පිළිබඳ ව අභියාචනා මණ්ඩලවල දී සලකා බලනු ලබන අතර අදාළ රෝග තත්ත්ව (පිළිකා, වකුගඩු රෝග, හදවත් සැත්කම් හා හදිසි අනතුරු ආදියෙන් සිදු වන බරපතළ ආබාධ) වෛද්‍ය මණ්ඩලය මගින් සනාථ විය යුතු ය.

7.5. ගුරු ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා ඉදිරිපත් කිරීම

7.5.1. ගුරු ස්ථාන මාරු තාවකාලික ලැයිස්තුව ප්‍රසිද්ධියට පත් කර, අභියාචනා මාර්ගගතව ඉදිරිපත් කිරීමට දින 14 ක කාලයක් ලබා දේ. එම කාල සීමාවෙන් පසුව ඉදිරිපත් කරන අභියාචනා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ශාඛාවෙන් සලකා බලනු නොලැබේ.

7.5.2. අභියාචනා ඉදිරිපත් කළ යුතු අවසන් දිනට පෙර අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ශාඛාව වෙත විදුහල්පති විසින් අභියාචනා අතින් ගෙනවිත් භාර දිය යුතුය. එම අභියාචනා, අභියාචනා මණ්ඩලය මගින් සලකා බැලීමෙන් පසුව ගුරු ස්ථාන මාරු අවසාන ලැයිස්තුව ප්‍රසිද්ධියට පත් කර ස්ථාන මාරු ලිපි නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

7.6. පහත සඳහන් අවස්ථාවල දී යෝග්‍ය පරිදි කටයුතු කරනු ලැබේ.

7.6.1. ආගමික ස්ථාන භාර පූජ්‍ය පක්ෂයේ ගුරු ස්වාමීන් වහන්සේ සහ වෙනත් ආගමික පූජ්‍ය ප්‍රසාදීන් වහන්සේලාගේ ගුරු ස්ථාන මාරු අවස්ථාවල, (ආගමික ස්ථානයේ භාරකාරත්වය තහවුරු කර ගැනීම අවශ්‍ය වේ.)

7.6.2. ආසන්නයේ ප්‍රාථමික පන්ති සහිත ජාතික පාසල් නොමැති අවස්ථාවල හා අනෙකුත් ජාතික පාසල්වලට ගැළපිය නොහැකි අවස්ථාවල,

7.6.2.1 අදාළ විෂය ගැලපිය නොහැකි දමිළ මාධ්‍යය විෂයයන් වෙනත් ආසන්න ජාතික පාසල්වල නොමැති අවස්ථාවල,

7.6.3. අ.පො.ස.(උසස් පෙළ) ඉංග්‍රීසි භාෂාව (විෂය අංක 73) විදේශ භාෂා විෂයයන්, දෙමළ මාධ්‍ය විෂයයන් උගන්වනු ලබන ගුරුවරුන් අනෙකුත් ජාතික පාසල්වලට ගැළපිය නොහැකි අවස්ථාවල,

7.6.4. යම් ගුරුවරයකු වැටුප් ලබන පාසල පිහිටි පළාතේ සිට වෙනත් පළාතක පිහිටි පාසලකට ස්ථාන මාරු ඉල්ලුම් කරන අවස්ථාවලදී පහත කොන්දේසි වලට යටත්ව ප්‍රමුඛතාවය ලබා දිය හැකිය.

a. පත්වීම් ලිපියේ කොන්දේසි උල්ලංඝනය නොවිය යුතුය.
b. ආසන්න පළාත් 2 ක් අතර මාරුවීම් ඉල්ලීම් කරන අවස්ථා වලදී වැටුප් ලබන පාසල සහ ඉල්ලුම් කරන පාසල අතර දුර 50km කට වැඩි විය යුතුය.
c. C/D පාසලක වසර 5 ක සේවා කාලයක් සපුරා ඇති ගුරුවරුන්ට වැඩි ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

7.7. ගුරු ස්ථාන මාරු නියෝගය අනුව කටයුතු නොකරන විදුහල්පතිවරුන් හා ගුරුවරුන් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 31 වගන්තිය අනුව ගනු ලබන තීරණවලට යටත් වේ.

7.8. සියලු ගුරු ස්ථාන මාරුවීම් සම්බන්ධ සියලු නිර්දේශ ලේකම්ගේ අවසාන අනුමැතියට යටත් වේ.

නාලක කළුවැව

ලේකම්